# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2018

**08 ශ්‍රේණිය** **නැටුම් (දේශීය)** **කාලය පැය 02**

**නම : .............................................................** **පාසල :.......................................................**

<u>සැලකිය යුතුයි</u>

❖ **I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

## I කොටස

- පහත සඳහන් ප්‍රකාශ හරි නම් (√ ) ලකුණද වැරදි නම් (X ) ලකුණද වරහන් තුල යොදන්න.

1) ගැමි නැටුම් නිර්මාණයේ දී සරල පද යොදා ගනී. ( )

2) නර්තන නිර්මාණයේ දී දිසා තල පිළිබඳ අවබෝධය වැදගත් වේ. ( )

3) පහන් මඩු ශාන්තිකර්මය පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්තිකර්මය වේ. ( )

4) කිසියම් අදහසක් ප්‍රකාශ වන චලන රිද්මයානුකූල චලන ලෙස හැඳින්වේ. ( )

5) උඩපැනීමේ ඉරියව්ව අයත්වන්නේ මැද තලයටය. ( )

- ගැළපෙන පිළිතුර තෝරා යා කරන්න.

| | |
|---|---|
| 6) පැල් කවි | සත් වෙත් මහත් අදර |
| 7) වන්නමකි | අනාඝාතාත්මක |
| 8) පොකුරු බෙරය | හනුමා |
| 9) සුළු මැදුම් දෙතිත | අවකාශ භාවිතය |
| 10) දිසා තල | තම්මැට්ටම |

නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

11) "පැවිය ගල් නැවෙන් ජය රුස් වඩින්නට ....." යන කවියේ මීලඟ පදය වන්නේ,

i) කාරිය තමයි සවරං ගෙන රඟන්නට ii) සූරිය දෙවි රජුනි අවසර දෙවන් මට

iii) වීරිය කර සිතින් සනදුරු හරින්නට iv) සියපත රුවින් වට රැලිකර තබන්නට

12) නර්තන විෂයෙහි නිවැරදි අංගහාර පවත්වා ගැනීම සඳහා,

i) ගීත වලට නැටීම කළ යුතුය.

ii) ප්‍රාසාංගික වේදිකාවේ නැටිය යුතුය.

iii) විවිධ ප්‍රසංග වලට දායක විය යුතුය.

iv) සරඹ නැටීම කළ යුතුය.

13) ගොප් ගෙඩියක් නිර්මාණයට පරිසරයෙන් ලබා ගත හැකි අමුද්‍රව්‍ය අයත් වන්නේ,

i) කෙසෙල් බඩ, රෙජිෆෝම්, ගම් ය.

ii) ඉරටු, ගොප් කොළ, ගම් ය.

iii) ගොප් කොළ, කෙසෙල් බඩ, ඉරටු ය.

iv) ගොප් කොළ, ඉරටු, ගම් ය.

14) අවුරුදු සමයෙහි දක්නට ලැබෙන ජන ක්‍රීඩා ලෙස,

i) පංච දැමීම, ගොයම් කැපීම හඳුන්වාදිය හැකිය.

ii) මේවර කෙළිය, රබන් නැටීම හඳුන්වාදිය හැකිය.

iii) පතුරු නැටුම, එළුවන් කෑම හඳුන්වාදිය හැකිය.

iv) ඔළිඳ කෙළිය, මේවර කෙළිය හඳුන්වාදිය හැකිය.

15) නර්තනය හා සම්බන්ධ චලන ක්‍රියාවලියේ දී අවධානය යොමු වන දිශා සහ තල ගණන වන්නේ,

i) දිසා 10 තල 03

ii) දිසා 08 තල 03

iii) දිසා 04 තල 02

iv) දිසා 04 තල 03

- පහත දැක්වෙන රූප සටහන ඇසුරෙන් 16 සිට 20 දක්වා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




16) මෙම රූපයේ දැක්වෙන නර්තන අංගය කුමක්ද?

......................................................

17) එම නර්තනය සඳහා ගායනා කරන කවියක මුල් පද පේළි 2ක් ලියා දක්වන්න.

.........................................................................................................................

.........................................................................................................................

18) මෙම නර්තන අංගය සඳහා යොදා ගන්නා රංග උපකරණයේ නම කුමක්ද?

......................................................

19) එම රංග උපකරණයෙහි සම්මත දිග සඳහන් කරන්න.

......................................................

20) මෙම නර්තනය කුමන නර්තන විශේෂයකට අයත් වූවක් දැයි සඳහන් කරන්න.

......................................................

## II කොටස

- ❖ **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- ❖ **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

(01) "පා සරඹ අභ්‍යාසයෙන් නිවැරදි හැඩතල සහිත වූ නර්තනයකට යොමු වෙමු." ක්‍රියාකාරකම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i) පා සරඹ ලය කීයකට ප්‍රගුණ කරයි ද? ඒ මොනවාද? (ලකුණු 04)

ii) ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අදාළ අටවන පා සරඹය ලියා දක්වන්න. (ලකුණු 03)

iii) පා සරඹ අභ්‍යාසයෙන් ඇති ප්‍රයෝජන තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)

(02)

i) සවරං නැටුමෙහි ස්වාභාවය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

ii) එම රංග උපකරණය චිත්‍රයට නගා එහි එන කවි පද පේළි දෙකක් ලියා දක්වන්න. (ලකුණු 03)

iii) සවරං නැටුම ලී කෙලි නැටුමෙන් වෙනස් වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(03) පහත සඳහන් මාතෘකා දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

i) පහතරට බෙරය

ii) ගොඩ සරඹ / ඉලංගම් සරඹ

iii) වන්නම්

iv) කොහොඹා යක් කංකාරිය / දෙවොල් මඩුව

v) ගැමි නැටුම්

(ලකුණු 5×2=10)

(04)

i) නව රාත්‍රී උත්සව හා බැඳි ආගමික පසුබිම කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 04)

ii) එහි එන සැරසිලි පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04)

iii) මේ සඳහා වාදනය කරන බෙරය කුමක්ද? (ලකුණු 02)